**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) සමාන බද්දක් හා අංක 1882/22 හා 2014.10.01 දිනැති ඉඩම් කට්ටි කිරීමේ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 15 වැනි වගන්තියේ සඳහන් සංවර්ධන සැළැස්ම හෝ අනු බෙදුම අනුමත කරවා ගැනීම සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී බදු හා ගාස්තු කොන්ත්‍රාත් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි. (එසේ වුවද නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල ඉඩම් අනුබෙදුම් කිරීම, ඒකාබද්ධ කිරීම හා සංවර්ධනය කිරීමේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 2235/54-2021/07/08 අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවල සඳහන් ගාස්තු අය කළ යුතුය.)

*උපලේඛනය*

| *ඉඩමේ ප්‍රමාණය* | *සංවර්ධන සැළැස්ම අනුමත කිරීම සඳහා ගාස්තුව රු. ශත* | *අනුබෙදුම අනුමත කිරීම සඳහා ගාස්තුව රු. ශත* |
|---|---|---|
| හෙක්ටයාර් 01 ට අඩු | 500 0 | 500 0 |
| හෙක්ටයාර් 01 ට වැඩි 02 දක්වා | 700 0 | 700 0 |
| හෙක්ටයාර් 02 ට වැඩි 04 දක්වා | 1,000 0 | 1,000 0 |
| හෙක්ටයාර් 04 ට වැඩි | 1,250 0 | 1,250 0 |

08 - 21/5

---

**අලව්ව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අයකිරීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2025 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.06.05 දින තීරණ අංක 3328 යටතේ මම තීරණය කරමි. එනම් ඃ

2025 වර්ෂය සඳහා පනවන ලද එම ගාස්තුව, දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 01 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 වන වගන්තිවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව, අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ බව 1998.08.28 වැනි දින අංක 1043 *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළකරනු ලැබූ අතර, එම අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව, අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට,

වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි. කරමි. (එසේ වුවද නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල ප්‍රචාරක දැන්වීම් සඳහා අනුමැතිය ලබා දීමේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 2235/54-2021/07/08 අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවල සඳහන් ගාස්තු අය කළ යුතුය.)

### *උපලේඛනය*

| | *ප්‍රචාරක දැන්වීම් විස්තරය* | *අවසර පත්‍ර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01. | ප්‍රචාරක වෙළඳ දැන්වීමක්, පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ස්ථානයක සවි කිරීමේ දී එක් හතරැස් අඩියකට (ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා) වසරකට | 150 0 |
| 02. | යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවි කර ඇති හෝ මහජනතාවට දැනගැනීමට හැකි වන පරිදි හෝ යම් තැනක සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට (තාවකාලික දැන්වීමක් සඳහා) මසකට | 50 0 |
| 03. | වෙන්දේසි ඉඩම් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් හතරැස් අඩියකට - මසකට | 100 0 |

08 - 21/6

---

### අලව්ව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ ප්‍රාදේශීය සභාවේ බලතල ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව පරිසර බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.06.05 දින තීරණ අංක 3329 යටතේ මම තීරණය කරමි. එනම් ඃ

2025 වර්ෂය සඳහා පනවන ලද එම බලපත්‍ර ගාස්තුව හා පරීක්ෂණ ගාස්තුව, පරිසර බලපත්‍රය ලබා දීමට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 01 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### යෝජනාව

වයඹ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන යම් ව්‍යාපාරයක් සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතු යම් තැනැත්තෙකු ගෙන්, පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් හා පරීක්ෂණ ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී ගාස්තුව බලපත්‍රය ලබාගැනීමට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි.